# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973
(HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


---

මගේ අංකය
எனது இலக்கம்
My NO
1167/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No
/ 2024

දිනය
திக
Date
15/07/2024
පැය 1555

## මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - මොරටුව පොලිස් වසම

2024.07.15 වන අද දින අළුයම් කාලයේ මොරටුව පොලිස් වසමේ රතුකුරුස වත්ත, ලක්ෂපතිය ප්‍රදේශයේ නිවසක සිටි පුද්ගලයෙකු නාඳුනන පුද්ගලයින් පිරිසක් විසින් කපා කොටා ඝාතනය කර ඇති බවට මොරටුව පොලිසියට ලද 118 දුරකථන පණිවිඩය මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 42 ක් වූ ලක්ෂපතිය, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මරණකරුගේ බිරිඳ සමඟ ඇතිව තිබූ ආරවුලක් දුරදිග යාම හේතුවෙන් බිරිඳ විසින් තම සහෝදරයා නිවසට කැඳවාගෙන ඔහුගේ සහයද ඇතිව තියුණු ආයුධයකින් පහර දී මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකාරිය සහ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - වැලිකන්ද පොලිස් වසම.

2024.07.15 වන අද දින උදෑසන කාලයේ වැලිකන්ද පොලිස් වසමේ වැලිකන්ද සිංහපුර මාර්ගයේ සිංහපුර ප්‍රදේශයේදී සිංහපුර දෙස සිට වැලිකන්ද දෙසට ධාවනය කරන ලද කැබ් රථයක් එහි රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් කැබ් රථයේ රියදුරු මිය ගොස් ඇති අතර කැබ් රථයේ ගමන් කල පුද්ගලයින් 05 දෙනෙකු තුවාල ලබා ප්‍රතිකාර සඳහා පොලොන්නරුව රෝහලට ඇතුලත් කර ඇත.

**මරණකරු වයස අවුරුදු 52 ක් වූ සිංහපුර, වැලිකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වැලිකන්ද රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**